**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව - 2020**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) පනතේ 6 (i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල සිදුකරන ලද එකතුව රු.8,516,530 ක් වූ සංවර්ධන ව්‍යාපෘති වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සංවර්ධන ව්‍යාපෘතිවල පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | පසුගිය වසර ණයහිමි වෙන්කිරීම් කර තිබූ රු.1,995,017 ක් වූ කර්මාන්තයක බිල්පත්‍ර සමාලෝචිත වර්ෂය තුල පියවීමේදී එම වටිනාකම වැය ලෙජරයට පිටපත් කිරීම මගින් වර්ෂයේ ප්‍රාග්ධන වියදම සහ වර්ෂය අවසාන දිනට ණයහිමියෝ රු.1,995,017 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2019 දෙසැම්බර් 19 දින ගිවිසුම්ගත වූ සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඉටු නොකල කර්මාන්තයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ණයහිමි වෙන්කිරීම් සිදුකිරීමෙන් වර්ෂයේ ප්‍රාග්ධන වියදම සහ වර්ෂය අවසාන දිනට ණයහිමියෝ රු. 1,040,340 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුල දරන ලද රු.1,357,525 ක් වූ වීථි පහන් උපකරණ මිලදී ගැනීමේ පුනරාවර්තන වියදම ලී බඩු සහ සවිකිරීම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අයභාර වියදම් සහ මූලධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | වර්ෂය තුල මිලදීගෙන ප්‍රාග්ධනිත කර තිබූ රු. 88,800 ක් වූ ස්ථාවර වත්කම් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය තුල පුනරාවර්තන වියදම් වශයෙන් ලියාහැරීමෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු. 88,800 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අයභාර වියදම් සහ මූලධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා රක්ෂණ වන්දි ලැබීම් ආදායම් ලෙස හඳුනා නොගෙන විවිධ තැන්පතු ගිණුමට බැර කිරීම තුලින් වර්ෂය සඳහා වන මෙහෙයුම් ආදායම රු. 103,500 ක් අඩුවෙන්ද, වර්ෂය අවසාන දිනට ජංගම වගකීම් ඊට සමාන ප්‍රමාණයකින් වැඩියෙන් ද දක්වා තිබුණි. | රක්ෂණ වන්දි මුදලට අදාළ වාහනයේ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් බිල්පත් ගෙවීම් සිදු කරන තුරු මෙම මුදල තැන්පත් ලෙස සලකා කටයුතු කර ඇති බව. | ගිණුම් වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2019 වර්ෂයේ පළාත් සහා ප්‍රතිපාදන යටතේ ලද පිරිවැය රු. 337,534 ක් වූ ඖෂධ තොගය රු. 737,534 ක් ලෙස ලෙජරයට පිටපත් කිරීමෙන් සිදුවූ දෝෂය නිවැරදි නොකිරීමෙන් වර්ෂය අවසාන දිනට ආයුර්වේද ගබඩාවේ තොග ශේෂය සහ සමුච්චිත අරමුදලේ ශේෂය රු. 400,000 ක් වැඩියෙන් දැක්වුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි තොග වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබූ අතර, ඒ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ප්‍රතිපත්ති වලින් බැහැර වීමක් පවතී නම් එය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. |
| (එ) | ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් සමාගමක් වෙත ගෙවිය යුතු රු. 1,308,730 ක මුදලක් නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නිමවී නොමැති සභාවට එරෙහිව පනවා තිබූ නඩුවක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. කෙසේ නමුත් මෙම නඩුව වෙනුවෙන් 2021 වර්ෂය අවසාන වනවිට රු. 461,500 ක නීති ගාස්තු ගෙවා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් වර්ෂය අවසාන දිනට පවතින අසම්භාව්‍ය වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමක් කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 08 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 11,651,579 ක වෙනසක් විය. | පෙර වර්ෂවල සිට පවතින මෙම වෙනසට හේතුව සොයා ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂ ඊට අදාළ උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 406,758,583 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විස්තරාත්මක උපලේඛන ඉදිරියේදී සකසන බව. | විස්තරාත්මක උපලේඛන හා කාලවිශ්ලේෂණ සැකසිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 25,153,522 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 18,534,795 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 4,773,619 ක් වූ හිඟ වරිපනම් ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්ත ශාලාවෙන් 2017 දෙසැම්බර් 31 දින දක්වා අය වීමට ඇති රු. 730,247.73 ක් වරිපනම් මහා භාණ්ඩාගාරයෙන් අය කර ගැනීමට පළාත් සභාව මඟින් නිර්දේශ කර ඇති බවත්, 2020 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ මෙම හිඟ ශේෂයන් අය කර ගැනීමට දේපල තහනම් කිරීම් සිදු නොකල අතර 2021 වර්ෂයේදී එම කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ජල ව්‍යාපෘති 03 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 879,003 ක් වූ ජල බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එක් ජල ව්‍යාපෘතියක් වසරකට වැඩි කාලයක් අක්‍රීයව පවතින බැවින් ජල සැපයුම නැවත ලබා දීමෙන් පසු හිඟය අය කර ගැනීමට කටයුතු කරන බවත්, අනෙක් ජල ව්‍යාපෘති දෙකෙහි ඉදිරි ගිණුම් වර්ෂයේ හිඟ ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව. | සභාව වෙත නියමිත ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ අංක 05 යටතේ ඇති අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල ඇති අනවසර ඉදිකිරීම් 25 ක් ඉවත් කිරීමට කටයුතු කලයුතු වුවත් එවැනි අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීමට හා ඉවත් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, අනවසර ඉදිකිරීම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | අදායම් පරීක්ෂකවරුන් හා කාර්මික නිළධාරීන් මඟින් අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීමට සැලසුම් කර ඇති බවත්, ඒ අනුව අනවසර ඉදිකිරීම් ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කරන බව. | යොමුගත විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂය සඳහා සභාව සතු සතිපොල 07 ක් බදුදීමේදී ටෙන්ඩර්කරුවන් සැලසුම්සහගතව ගිවිසුම්ගතවීමට ඉදිරිපත් නොවීම මඟින් ටෙන්ඩර් මුදල අඩුකිරීමට බලපෑම් කර තිබූ බව නිරීක්ෂණය විය. 2019 වර්ෂය සමඟ සැසඳීමේදී සතිපොල බදුදීම තුලින් සමාලෝචිත වර්ෂය තුලදී අහිමි වූ ආදායම රු. 1,599,000 ක් විය. | විගණනයේ පෙන්වා දීම පිළිගන්නා බවත්, 2018 වර්ෂය වනවිට සතිපොල සඳහා වූ දැඩි තරඟකාරීත්වය නිසා සතිපොල සඳහා අධිතක්සේරුවක් නිර්මාණය වී බදුකරුවන් වෙලඳුන්ගෙන් වැඩි ගාස්තු අය කිරීම පොල බදු කරුවන්ගෙන්ද කුඩා එලවළු වෙලදසැල් රාශියක් බිහිවීම වැනි හේතු නිසා සතිපොල වෙලදුන් අඩුවී නිසා මෙම මුදල අයකර ගැනීමට නොහැකි බවට මැසිවිලි ඉදරිපත් වුණු බව. | විධිමත් ටෙන්ඩර් පටිපාටියක් ක්‍රියාත්මක කිරීම මඟින් සතිපොල බදුදීම කටයුතු කළ යුතුය. |